# සැදැහැවතුන් ගේ වන්දනා

01. බුදු සමිඳු ගේ නෙතින්
ගලා කරුණා දහර
ඇවිල ගිය සිත් සතන්
නිවී සැනසී ගියා

02. එකම බණ පදයෙනුත්
ගලා නැණ රැස් දහර
අඳුරු ජීවිත පුරා
එළිය විහිදී ගියා

03. දුගී පැල්පතේ හෝ
බමුණු සිටු කුලේ හෝ
දුකින් මුදවා ගන්ට
බොහෝ දුර වඩිනවා

04. මහ වැස්සේ තෙමෙනවා
හිරු රැසින් දැවෙනවා
කුසගිනි ද දැනෙනවා
බුදු සමිඳු වඩිනවා

05. මිහිරි බණ දෙසන විට
අමා ගඟ ගලනවා
කන් යොමා බලනවා
සිත සෝක නිවෙනවා

06. ගුණ නුවණ වැඩෙන විට
සසර දුක ගෙවෙනවා
බුදු ගුණය සිතන විට
නිවන් සුව දැනෙනවා

07. වඩින විට පිඬු සිගා
නෙත් කැළුම් බිම යොමා
බෙදන්නට දන් පිඬක්
අනේ මට බැරිවුණා

08. සිරි පතුල් වෙහෙසුනා
අප ගැන ම සොය සොයා
පිරිනිවි වැඩි සේක
මගේ සම්බුදු පියා

09. බුදු නෙතින් බලා ලොව
සිතේ දුක නිවා දුන්
බුදු මුවින් ගලා ආ
මිහිරි දම් අමා දුන්

10. බුදු ගුණෙන් සදා සිත්
සැනසීම ලබා දුන්
බුදු සරණ යමු අපිත්
පිළිසරණ සදා දුන්

11. හිරු උදාවනු මිසක
අඳුර එන්නට එපා
දෙපා පැටලුනු විටක
බිම වැටෙන්නට එපා

12. ජීවිතය කිසි දිනක
නොමග යන්නට එපා
බුදු සමිඳු නැති ලොවක
කිසි දෙයක් මට එපා

13. දුක මගේ නැති වෙලා
වැරදි දේ දුරු වෙලා
සුපිපි කුසුමක් ලෙසේ
ලොව සුවඳ කෙරෙවා

14. තන්හාව දුරු වෙලා
දුක මගේ නැති වෙලා
සදාකාලික අමා
නිවන් සුව ලැබේවා !!!

# කරණීය මෙත්ත සූත්‍රය සිංහලෙන්

01. නිවනට යන මග සිටින පතා ගෙන
ඇද නැති බව සිත තුළ රඳවා ගෙන
සුවච සුමුදු ගුණ ඇති කරවා ගෙන
කළ යුතු ම ය අතිමාන නසා ගෙන

02. සතුටුව ලද දෙයක් සුවසේ හිඳ
අඩු කොට වැඩ නිති සැහැල්ලුවෙන් ඉඳ
දමනය කළ ඉඳුරන් ද නුවණ මැද
හිත මිතුරුව කුලයේ නො ඇලෙන සඳ

03. නුවණැතියන් ගෙන් දොස් නොලබන්නේ
සුළු වරදක් හෝ නොම කරමින්නේ
බිය නැති සැප ඇති දිවි පතමින්නේ
සියළු සතුන් හට මෙත් පතුරන්නේ

04. බියපත් තැති ගත් සතුන් ද වේවා
බිය සැක දුරු කළ රහතුන් වේවා
ලොකු පොඩි දිග මහා සතුන් ද වේවා
සැමට සැපත ඇති සිත් ඇති වේවා

05. පෙනෙන නො පෙනෙනා සතුන් ද වේවා
දුර ළඟ වසනා සතුන් ද වේවා
ඉපදුන - ඉපදෙන සතුන් ද වේවා
සැමට සැපත ඇති සිත් ඇති වේවා

06. කිසිවෙක් කිසිවෙකු නොම රවටාවා
කිසි තැනක දී ඉහළින් නොසිතාවා
නපුරු දරුණු බස් නොම පවසාවා
අනිකකු ගේ දුක කැමති නොවේවා

07. තම දිවි සමකොට පුතු සුරකින්නේ
එක ම පුතෙකු ඇති මව් විලසින්නේ
මෙලෙසට ලොව හැම සතුන් දකින්නේ
අපමණ මෙත් සිතමය පතුරන්නේ

08. සියළු ලොවට එක ලෙස සලකන්නේ
උඩ, යට, සරසට හැම විලසින්නේ
වෛර සතුරු බාධා නැති වන්නේ
අපමණ මෙත් සිතමය පතුරන්නේ

09. සිට ගෙන, ඇවිදින හෝ හිඳිනා විට
නිදන වෙලාවට හෝ නො නිදන විට
සිහි කළ යුතු මෙත් සිතමය හැම විට
බඹ විහරණ ලෙස පවසයි එම විට

10. මිසදිටුවක සිත නො ම පැටලෙමින්නේ
සිල් ගුණ දම් රැක, යන මග නිවනේ
කම් සැපයට කිසිවිට නො ඇලෙමින්නේ
මව් කුස නිදනට යළි නොම පැමිණේ

**සාදු ! සාදු !! සාදු !!!**